# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය

සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

நிதி அமைச்சு

சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு

Ministry of Finance

State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/IT/11/CRM | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................ | දිනය<br>திகதி<br>Date | 2021.05.10 |
|---|---|---|---|---|---|

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

ප්‍රාදේශීය ලේකම්,

සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ,

සමෘද්ධි කළමනාකරු හා සමෘද්ධි සංවර්ධන නිලධාරි,

## <u>CRM පරිගණක වැඩසටහනේ ප්‍රජා මූල බැංකු සමිතියේ කාර්යය භාරයන්</u>

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයන් වඩා කාර්යක්ෂමව ඉටුකිරීම හා අඩු ආදායම් ප්‍රජාවට කාර්යක්ෂම සේවාවක් ලබාදීමට තොරතුරු තාක්ෂණය භාවිතා කරයි. මෙම කාර්යය සඳහා සකස්කර ඇති එක් පරිගණක වැඩසටහනක් වන CRM මොඩියුලය තුළින්,

1. සහනාධාරලාභී තොරතුරු
2. සමාජ ආරක්ෂණ ගෙවීම්/ ඉල්ලීම් තොරතුරු
3. සමෘද්ධිලාභීන් හා අඩු ආදායම්ලාභීන් සඳහා කරනු ලබන ජීවනෝපාය ව්‍යාපෘති තොරතුරු
4. විදුලිය නොමැති පවුල් සඳහා විදුලිය ලබාදීමේ තොරතුරු රැස්කිරීම
5. Covid 19 ව්‍යවසනය නිසා රු.5000/- දීමනාව ගෙවූ පවුල් තොරතුරු

යන කරුණු පිළිබඳව තොරතුරු ඇතුළත් කිරීම, අවශ්‍ය ප්‍රගති වාර්තා ලබා ගැනීම් සිදු කරයි.

02. ඉහත සඳහන් කාර්යයන්ගෙන් ව්‍යාපෘති තොරතුරු, විදුලිය සමීක්ෂණය, Covid ආධාර ලැබූ පවුල් තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යෑම හා තොරතුරු යාවත්කාලීන කිරීම නිසි පරිදි තොරතුරු ඇතුළත් නොකළ කොට්ඨාසයන්හි තොරතුරු කඩිනමින් දත්ත පද්ධතියට ඇතුලත් කරවීම ප්‍රජා මූල බැංකු සමිතිය සතු කාර්යයක් බව මෙයින් දැනුම් දෙමි.

03. මෙම පද්ධතිය සඳහා ඇතුල් වීමට crm.esamurdhi.gov.lk යන වෙබ් ලිපිනය භාවිතා කොට ප්‍රජා මූල බැංකු සමිති වෙත සකස් කොට ඇති පරිශීලක නාමය (User Name) ලෙස ss(ප්‍රජාමූල බැංකු සමිතියේ නම)@samurdhi.lk යන්න ද මුරපදය (Password) ලෙස 54321 යන්නද භාවිතා කළ යුතුය. පළමු වරට මෙම මුරපදයෙන් පද්ධතියට ඇතුල් වී පද්ධතිය මුහුණතෙහි දකුණු පස උඩ ඇති භාවිතකරුගේ නම සඳහන් ස්ථානියේ ඇති Edit Profile භාවිතයෙන් මුරපදය වෙනස් කර ගත යුතුය.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

04. මෙම පද්ධතියේ වාර්තා Reports භාවිතයෙන් තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ව්‍යාපෘති තොරතුරු, විදුලි ඉල්ලුම්කරු, Covid 19 ආධාරලාභී තොරතුරු සියල්ල විස්තරාත්මකව හා සංඛ්‍යාත්මකව බලා ගත හැකිය.

05. මෙම තොරතුරු තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළව යාවත්කාලිනව පවත්වාගෙනයෑම ප්‍රජා මූල බැංකු සමිතියේ නිලධාරින්ගේ වගකීමකි.

06. Covid 19 වසංගතය නිසා 2020 අප්‍රේල් / මැයි මාස වලදී රු.5000/- දීමනාව ගෙවූ තොරතුරු CRM මොඩියුලයට ඇතුළත් කිරීමට උපදෙස් දෙන ලදි. නමුත් එම සියලු තොරතුරු පද්ධතියේ යාවත්කාලීන නොවී ඇති බව නිරීක්ෂණය විය. CRM මොඩියුලයේ දැනට අඩුපාඩු පවතින කොට්ඨාස ප්‍රධාන කාර්යාලයේ නිලධාරින් සමඟ සම්බන්ධ වී එම තොරතුරු සම්පූර්ණ කිරිමට කටයුතු කළ යුතුය. මෙම තොරතුරු 100% ක් සම්පූර්ණ කළ විට 2021 අප්‍රේල් මස රු.5000/- ගෙවීම් කළ **තොරතුරු නැවත පද්ධතියට ඇතුලත් කිරීමට අවශ්‍ය නොවේ.**

07. මෙම කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා ඔබ කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති A+ නිලධාරියා, උපාධිධාරි පත්වීම් ලබාදී ඇති නිලධාරින්ගේ සහායද ලබා ගැනීමට කටයුතු කරන්න.

08. මෙම කාර්යයන් සම්බන්ධ වැඩිදුර කරුණු අවශ්‍යනම් තොරතුරු තාක්ෂණ අංශයේ පහත නිලධාරින් අමතන්න.

- එම්.දේවන්රාජ - 0714396406
- සමින්ද බණ්ඩාරනායක - 0718813836
- චින්තා පතිරගේ - 0716497277
- තුෂාරි අබේසිංහ - 0714425369
- දීපා නෙලානි - 0763971544
- සිසිර දිසානායක - 0714446088
- නුවන් දිමුතු සම්පත් - 0763967796

ආර්.පී.බී.තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

1. ලේකම් - ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකිය හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය කා.දැ.ස